# ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

ළමා ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ
පසු පිටු සකස් විය යුතු ආකාරය
පිළිබඳ නියමු අත්පොත

# ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

## ළමා ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමු අත්පොත


සම්පාදනය

**සේනානි ගුණතිලක බණ්ඩාර**

**සජන්ති බෝපිටිය**



**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

පළමු මුද්‍රණය 2018

ISBN: 978-955-7544-28-1

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද
ප්‍රකාශනගත සුචිකරණ දත්ත

ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය : සම්පාදනය සේනානි ගුණතිලක බණ්ඩාර
සහ සජන්ති බෝපිටිය. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා
මණ්ඩලය, 2018
පි. 40 : චිත්‍ර ; සෙමී. 21

ISBN 978-955-7544-28-1 මිල : රු. 250.00
i. 070.5 ඩිවි 23 ii. බණ්ඩාර, සේනානි ගුණතිලක (සම්.)
iii. බෝපිටිය, සජන්ති (සම්.)

1. ප්‍රකාශකයෝ සහ ප්‍රකාශන
2. පොත් කර්මාන්තය හා වෙළඳාම

ප්‍රකාශනය : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථනය: 011 2687583, 011 2698847
ෆැක්ස්: 011 2687583, 011 2685201
ඊමේල්: nldsb@mail.natlib.lk

මුද්‍රණය : ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත,
කොළඹ 10.

## උපදේශක දායකත්වය

ආචාර්ය ඩබ්ලියු ඒ. අබේසිංහ මහතා
විජිත වෙලගෙදර මහතා
සුමිත්‍රා රාහුබද්ධ මහත්මිය
රන්ජිත් ධර්මකීර්ති මහතා
දෙනගම සිරිවර්ධන මහතා
සිබිල් වෙත්තසිංහ මහත්මිය
පියල් උදය සමරවීර මහතා
ජේ. මදිවානම් මහතා
ආර්. එච්. එන්. නන්දසිරි මහතා
උදිත අලහකෝන් මහතා
පී. ජී. ප්‍රේමදාස මහතා
එච්.ඩී. ප්‍රේමසිරි මහතා
දිනේෂ් කුලතුංග මහතා
මහාචාර්ය දයාරෝහණ අතුකෝරල මහතා
ඩබ්ලිව්. සුනිල් මහතා
ශ්‍රීමා සූරියබණ්ඩාර මහත්මිය

# පෙරවදන

ළමා සාහිත්‍යය යනු සමාස පදයකි. එමගින් කරුණු දෙකක් ගම්‍ය වේ. පළමුවැන්න වැඩිහිටියන් විසින් දරුවන් සඳහා රචනා කරනු ලබන සාහිත්‍යය හා දෙවැන්න ළමයින් විසින් ළමයින් සඳහාම රචනා කරනු ලබන සාහිත්‍යයි. සෑම රටකම අනාගතය රඳා පවතින්නේ එම සමාජයේ වැඩිහිටියන් විසින් ළමා පරපුරට ලබා දෙනු ලබන සමාජ දායාද මතය. දරුවෙකු මෙලොවට බිහිවීමේ සිට ක්‍රමයෙන් පරිණත වී ස්වාධීනව කටයුතු කිරීමට ශක්තිය ලබන තෙක් ළමයාගේ පූර්ණ වර්ධනයට අවශ්‍ය කටයුතු සැපයීම හා පරිසරය සකසාලීම වැඩිහිටි දෙමාපියන්ගේ භූමිකාව වන්නේය. ඒ අනුව මෙම මානව සංවර්ධනය අර්ථවත්ව හා ගුණාත්මකව ක්‍රියාත්මක කිරීමෙහිලා සාහිත්‍යයට ඉටුකළ හැකි අගය අපමණය.

ළමා සාහිත්‍ය කෘතියක් මගින් දරුවන්ගේ වාග් මාලාවට අලුත් වචන එකතු කිරීම නිදහස් චින්තනය පරිකල්පනය වර්ධනය කිරීම ඇතුළුව දරුවන් සමාජානුයෝජනය කිරීමේ හැකියාවද පවතී. ළමයාගේ සංවර්ධනය කෙරෙහි සාහිත්‍යය සහ අමතර කියවීම ඉතාම වැදගත් වන අතර මෙම සංකල්ප මත පදනම්ව ළමා සාහිත්‍යය විෂය තුළ ළමා හා යොවුන් සාහිත්‍ය කෘති බිහි විය යුතුය. එහෙත් වර්තමානයේදී සාහිත්‍ය කෘති පළ කිරීම කුමන අරමුණක් කරා මෙහෙයවිය යුතු ද යන්න පිළිබඳව අදාළ පාර්ශ්වකරුවන් බහුතරය තුළ පැහැදිලි අවබෝධයක් නොමැත. මේ නිසා ප්‍රමිතියකින් හා ගුණාත්මක බවින් තොරව බිහිවන ළමා කෘති දරුවන්ගේ ලෝකයට සිදු කරනු ලබන හානි අපමණය. ඒ අනුව දරුවන්ගේ කියවීම උදෙසා ඵලදායී ළමා සාහිත්‍යයක් ගොඩනැංවීම හා දරුවන් කියවීම වෙත නැඹුරු කරවීම යුගයේ අවශ්‍යතාවකි. මීට සාපේක්ෂව ළමා ග්‍රන්ථ ප්‍රකාශනයන්හි දැනට පවතින ගුණාත්මක බව ඉහළ නැංවීම කෙරෙහිද අවධානය යොමු කළ යුතුය. ළමා ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රමිති භාවිත නොකිරීම බොහෝ ප්‍රකාශනවල දක්නට ලැබේ. ග්‍රන්ථයක මුල් පිටු අන්තර්ගතය සහ පසුපිටු සකස් විය යුතු සම්මත ආකරය ඇතුළු සමස්ත සැකැස්ම පිළිබඳව සමහර ප්‍රකාශකයන් හා ලේඛකයින් සතු අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නොපැවතීම මෙම තත්ත්වයට බලපා ඇත. විශේෂයෙන් කර්තෘ ප්‍රකාශනවල මෙම දුර්වලතා බහුලව දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගුණාත්මක උන්නතිය උදෙසා පසුගිය කාලය පුරා සක්‍රීය දායකත්වයක් සැපයූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් මෙම කරුණ කෙරෙහි සිය අවධානය යොමු කර ළමා ග්‍රන්ථකරණයට මග පෙන්වීමක් ලෙස මෙම කෘතිය එළිදැක්වීමට කටයුතු කරන ලදි.

ලේඛකයින්, ප්‍රකාශකයින්, මුද්‍රණකරුවන් සහ ප්‍රකාශන ක්ෂේත්‍රයට සම්බන්ධ ආධුනිකයන් හට ඉතා ප්‍රයෝජනවත් වන මෙම ග්‍රන්ථය එළිදැක්වීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දුන් මණ්ඩලයීය අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් මහතා, උපදේශක මණ්ඩලයේ විද්වතුන්, ග්‍රන්ථ සම්පාදන කටයුතු සිදුකළ අධ්‍යක්ෂිකා සේනානි බණ්ඩාර මහත්මිය හා ප්‍රකාශන නිලධාරිනී සජන්ති බෝපිටිය මහත්මිය, අක්ෂර සංයෝජනය කටයුතු සිදු කළ මානෙල් චාන්දනී මහත්මිය, තනූජා රංගිකා මහත්මිය සහ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයේ හිටපු අංශ ප්‍රධාන සහකාර අධ්‍යක්ෂිකා ශ්‍රීමා සූරියබණ්ඩාර මහත්මිය, අනුරුද්ධිකා දිසානායක මහත්මිය ඇතුළු ප්‍රකාශන අංශයේ කාර්යමණ්ඩලයට ස්තූතිය පුද කර සිටිමි. එසේම මෙම ග්‍රන්ථයෙහි මුද්‍රණ කටයුතු සිදු කළ ෆාස්ට් ප්‍රින්ටරි ආයතනයේ ප්‍රේම් දිසානායක මහතා ඇතුළු කාර්යමණ්ඩලයට හා සහාය දුන් සැමට මාගේ හෘදයංගම ස්තූතිය පුද කර සිටිමි.

**නීතිඥ පී.එම් දීපාල් චන්ද්‍රරත්න**
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14
නිදහස් මාවත
කොළඹ 07
2018 දෙසැම්බර්

# හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයේ ආරම්භ යුගයටත් පෙර සිටම දරුවන් සඳහා කතාන්දර කියා දීම, අසා සිටීමට සැලැස්වීම, නාට්‍යමය ආකාරයෙන් රඟ දක්වා පෙන්වීම පැවැතිණි. කාර්මික විප්ලවයෙන් අනතුරුව සිදුවූ මුද්‍රණ කර්මාන්තය ඇතුළු විවිධ අංශයන් හි දියුණුවත් සමඟ එතෙක් පවුල් පරිසරය තුළින් ලැබූ මෙම වින්දනය සමාජයක්, රටක් හා ඉන් අනතුරුව ලෝක මට්ටමෙන් ළමයා වෙත ළඟාවන්නට විය. ඒ අනුව දනට සියවස් කිහිපයක සිට ළමයින් සඳහා විවිධ සාහිත්‍ය නිර්මාණ මහා පරිමාණ වශයෙන් වාණිජ මට්ටමෙන් ලෝකය තුළ එළි දකී. ඒ අතර ළමා කතාන්දර පොත්වලට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. රසවින්දනය, භාෂාවේ දක්ෂතාවක් ඇති කිරීම සඳහා වන අතිරේක කියවීම් පොත් වශයෙන් භාවිත කිරීමට ළමා සාහිත්‍ය කෘති බිහිවිය. එසේම ළමා සාහිත්‍යයක වැදගත්කම හා අවශ්‍යතාව පිළිබඳ දීර්ඝ කාලීන ලෙස සාකච්ඡාද සිදුවිය. ළමා මනසේ සංවර්ධනයට මෙන්ම ළමයෙකුගේ පෞරුෂය ගොඩනැගීමට ගුණාත්මක මට්ටමේ ළමා කෘති බහුල විය යුතු බව ලෝකයේ බොහෝ රටවල විද්වතුන් අවිවාදයෙන් පිළිගෙන ඇත. ශ්‍රී ලාංකේය ළමා සාහිත්‍යය තුළ අද වන විට සංඛ්‍යාත්මකව ළමා ග්‍රන්ථ බහුලව මුද්‍රණය වුවත්, ඒවායේ ගුණාත්මක මට්ටම සම්බන්ධයෙන් පවතිනුයේ කිසිසේත් සෑහීමකට පත්විය නොහැකි තත්ත්වයකි. ඒ අතර, නවීන තාක්ෂණය, සමග බිහි වූ නියාමනයක් නොමැති විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් දරුවන් සමාජයේ විවිධ වූ ව්‍යසනයන්ට ගොදුරු වන ආකාරය එම මාධ්‍ය තුළම දිනපතා පළ වේ.

මෙම ව්‍යසනයෙන් දරුවන් මුදා ගැනීමෙහිලා මුල් අඩිතාලම වශයෙන් ඔවුන්ගේ රුචිය උසස් මට්ටමකට නංවන ගුණාත්මක ළමා සාහිත්‍යයක් බිහි කිරීම සම්බන්ධයෙන් ලේඛකයා වෙත පැවරෙන්නේ දැවැන්ත සමාජමය වගකීමකි.

නිසි ප්‍රමිතියෙන් යුත් සාර්ථක ළමා සාහිත්‍යයක් නිර්මාණය කිරීම සඳහා ලේඛකයන් දැනුවත් විය යුතු කරුණු රාශියක් තිබේ. එම අංශ මැනවින් අධ්‍යයනය කිරීම තුළින් ලේඛකයන්ට සිය ලේඛන කාර්යය සඳහා අත්දැකීම් රාශියක් ලබා ගත හැකිය. නිර්මාණකරුවෙකුට සිය නිර්මාණය කෙසේ සකස් විය යුතුද යන්න පිළිබඳ සීමාවන් හෝ නීති පැනවීමට නොහැකි වුවත්, ළමා සාහිත්‍ය කෘති බිහි කරන්නේ දරුවන් වෙනුවෙන් නිසා ඒ පිළිබඳ නියමුවක් අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ.

# පටුන


(1) හැඳින්වීම ix

(2) ළමා සාහිත්‍ය කෘතියක අන්තර්ගතයේ මූලිකාංග 1

2.1 සාහිත්‍යමය සන්දර්භය ගොඩනැංවීම

2.1.1 කතාවේ තේමාව 2
2.1.2 ග්‍රන්ථ නාමය 3
2.1.3 පසුතලය 3
2.1.4 චරිත 4
2.1.5 කතා වස්තුව සැකිල්ල 5
2.1.6 ගැටුම 6
2.1.7 කතාවේ අවසානය 6

2.2 භාෂා භාවිතය 8

2.2.1 වාග්මාලාව 8
2.2.2 වාක්‍ය රටා 9
2.2.3 භාෂා උපක්‍රම 9
2.2.4 අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ 9

2.3 පින්තූර, චිත්‍ර හා වර්ණ භාවිතය 10

(3) ළමා ග්‍රන්ථයක භෞතික නිමාව 16

3.1 අර්ධ ග්‍රන්ථනාම පිටුව 16
3.2 අර්ධ ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව 17
3.3 ග්‍රන්ථනාම පිටුව 18
3.3.1 ග්‍රන්ථනාමය 18
3.3.2 කර්තෘ 18
3.3.3 ප්‍රකාශක 19
3.3.4 පුස්තකාල බලපත්‍රය 19

| | | | |
|---|---|---|---|
| 3.4 | | ග්‍රන්ථ නාම පිටුවෙහි පසු පිටුව | 20 |
| | 3.4.1 | අනුග්‍රහය පිළිබඳ ප්‍රකාශය | 20 |
| | 3.4.2 | කර්තෘ හිමිකම් ප්‍රකාශය | 20 |
| | 3.4.3 | පුනර් මුද්‍රණය | 21 |
| | 3.4.4 | අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) | 21 |
| | 3.4.5 | පාසල් පුස්තකාල බලපත්‍රය | 22 |
| | 3.4.6 | ග්‍රන්ථය සඳහා දායක වූවෝ | 22 |
| | 3.4.7 | ප්‍රකාශක | 23 |
| | 3.4.8 | බෙදාහැරීම | 23 |
| (4) | | පිටකවර සකස් කිරීම | 23 |
| (5) | | පිටු අංකනය කිරීම | 25 |
| (6) | | අකුරු ප්‍රමාණය හැඩය හා යෙදවීම | 25 |
| (7) | | ග්‍රන්ථයේ සමස්ත නිමාව | 26 |